# බරපතල දේවල් හෙට දවසට

## මාරාන්තික තීරණයක්



# බරපතල දේවල් හෙට දවසට

## මාරාන්තික තීරණයක්

අවුරුදු ගණනාවකට පෙර, අකියස් නම් පාලකයෙක් ග්‍රීසියේ සිටියා. ඔහු සැපසෙල්ලම වෙනුවෙන් ජීවත්වූ, තමාගේ ජනයාගේ උවමනා ගැන ස්වල්ප හෝ කිසි සැලකිල්ලක් නොදැක්වූ ඉතා ආත්මාර්ථකාමී මනුෂ්‍යයෙක් විය. බොහෝ අය ඔහුට වෛර කළා. අන්තිමට, සමහරු ඔහුව මරන්ට කුමන්ත්‍රණ කළා. ඇත්තටම, කුමන්ත්‍රණය ගැන අකියස් මොනවත් දැනගෙන සිටියේ නෑ. එහෙත්, එය ගැන ඇසූ මිත්‍රයෙක් දුර පිහිටි ඇතන්ස් නගරයේ සිටියා. වහාම මේ ගැන අනතුරු අඟවන්නට ඔහු ක්‍රියා කළා. තමා මුහුණ පාන්නට යන මහත්වූ අනතුර ගැන අනතුරු ඇඟවීමක් දෙන්නට ඔහු ලියුමක් ලිව්වා. ඒ ලියුම තුල එයින් බේරෙන්නට හැකි මාර්ගයක් පෙන්වා තිබුණා. පණිවුඩකාරයෙක් තුලින් ඔහු එය හදිස්සියෙන් ඉක්මනට එව්වා.

පණිවුඩකාරයා පැමිණි විට, අකියස් විශාල භෝජන





සංග්‍රහයක් පවත්වමින් සිටියා. එහෙත්, ඔහු ඇතන්ස් නගරය සිට වැදගත් ලියමනක් රැගෙන, ඉතා දුර ගමනක් පැමිණි නිසා, ඔහුව ඒ වේලාවේම රජු ඉදිරියට ඇතුල් කරා "මගේ ස්වාමිනි, මේ ලියමන එවූ තැනැත්තා ඔබෙන් බැගෑපත්ව ඉල්ලන්නේ, එය බරපතල කාරනාවල් පිළිබඳව කියන නිසා ඔහු එය වහාම කියවන ලෙසයි" කියා ඔහු කිව්වා. අකියස් මත්පැනින් වෙරි වී, සැපසෙල්ලමට හිත යොමු කරමින් සිටිය නිසා ඒ ලියමන කියවීමට ඔහු තුල ආශාවක් තිබුනේ නෑ. ඒ ලියමනේ සඳහන් කරුනු මොනවද කියා අනුමානයක් නැතුව, "බරපතල කාරනාවල් හෙට දවසටයි" කියමින්, සිනාසෙමින් ඔහු එක අහකට විසි කළා. ඉන් පසුව, ඔහු තමාගේ සැප සෙල්ලමේ යෙදීමේ කායඨීය කරගෙන යන්ට විය.

අහෝ, අවාසනාවකට මේ අසරණ මිනිසාට හෙට දවස ආවේ නෑ. තව වතාවක් ඔහුට අනතුරු ඇඟවීමක් ලැබුනේ නෑ. ඔහුගේ සැන්දෑවේ සැප සෙල්ලම කනගාටු සහ හදිස්සි අන්දමින් කෙළවර වුණා. භෝජන සංග්‍රහයේ උත්සවශ්‍රීයේ උග්‍ර අවස්ථාවේදී, ඔහුව මරන්ට



කුමන්ත්‍රණය කල අය, ඉදිරියට වේගයෙන් දුව ගොස් ඔහුව මැරුවා.

සමහරවිට, ගැළවීම නැති, මේ පත්‍රිකාව කියවන ඔබ, සෞඛ්‍ය සනීපයෙන් සිටිමින්, සැපසෙල්ලමින් යුත් සන්ධ්‍යාවක් ගතකිරීමට බලාපොරොත්තුවෙන් සිටිනවා වෙන්ට ඇත. ඔබගේ ප්‍රාණයේ අභිවෘද්ධිය වැනි කරුනු ගැන මේ දැන්ම සැලකිල්ලෙන් සිතා බැලීම ඉතා බරපතල බවත්, අකියස් කී ලෙස "බරපතල දේවල් හෙට දවසට" යයි ඔබ කියනවා ඇත.

එහෙත් නවතින්න හෙට දවස සමහරවිට එන්නේ නෑ. අද මෙලොව ඔබේ අන්තිම රාත්‍රිය වීමට ඉඩ ඇත. අවුරුදු ගණනාවකට පෙර, ධනවත් ගොවියෙකුට කිව්ව ලෙස ඔබටත්, **"අඥානය අද රාත්‍රියේදී ඔබේ ප්‍රාණය නුඹෙන් අය කරනු ලැබේ"** යැයි දෙවියන්-වහන්සේ ඔබට කිව්වොත්, ඔබගේ තත්වය කොහොමද? ඔබ මේ වගේ බරපතල සිතුවිලිවලට අකමැති ලෙස සිතනවා වෙන්ට ඇත. තවද, ඔබගේ ප්‍රාණයේ සතුරා වන යක්ෂයා මේ මොහොතේදී, ඔබට මේ පත්‍රිකාව

ඉවතට දලා, එහි තිබෙන සංවේගාත්මක පණිවිඩය අමතක කිරීමට සොයනවා. එහෙත්, ඒ පත්‍රිකාව තුළින් දෙවියන්වහන්සේ ඔබට ප්‍රේමාන්විත පණිවිඩයක් එවනවා ඇත. ඒක ඔබ මුහුණපාන්නට නියමව තිබෙන විනිශ්චය ගැන කලින් අනතුරු ඇඟවීමක් වෙනවා ඇත. එහෙත්, එම වෙලාවේම ඒක එයින් බේරීමට හැකි මාර්ගයක් පෙන්වයි.

ඒ මාර්ගය නම්, ඔබ වෙනුවෙන් කුරුසිපත් වුන යේසුස් ක්‍රිස්තුස්වහන්සේය. ඒ අන්ධකාරයෙන් පිරුනු පැය තුන තුල ඔබයි මමයි විඳින්ට තිබුන දෙවියන්වහන්සේගේ, පාපයට විරුද්ධ විනිශ්චය උන්වහන්සේ වින්දා. උන්වහන්සේ මැරුණා, මළවුන්ගෙන් නැගිට්ටා. උන්වහන්සේ දැන් ස්වර්ගයේ දෙවියන්වහන්සේගේ දකුණු අතේ ඉඳගෙන සිටිනවා. උන්වහන්සේ තුල විශ්වාස කරන සැම දෙනාටම දෙවියන් වහන්සේ දැන් නොමිලේ සමාව පිරිනමනවා. සමාව ගැන සඳහන් කරන මේ ප්‍රකාශය මෙසේ කියයි. **ඒනිසා, සහෝදරයෙනි, උන්වහන්සේ කරණකොටගෙන පව් කමා කිරීම ඔබලාට ප්‍රකාශ කරනු ලබන බව දැනගන්න, අදහාගන්නාවූ සියල්ලෝම උන්වහන්සේ කරණකොටගෙන සියලු දේවල් පිළිබඳව නිර්දෝෂ කරනු ලබති."** (ක්‍රියා 13:38-39)

මේ කලින් අනතුරු ඇඟවීමෙන් යුක්තවූ පණිවිඩයට ඔබ කන්දී ඔබගේ ආරක්ෂාව පිණිස, ක්‍රිස්තුස් වහන්සේ වෙතට ඔබ එනවාද? නැත්නම් අකියස් වාගේ ඔබත් "බරපතල දේවල් හෙට දවසට කියා එය අහකට දමනවාද? මිත්‍රය, ඔබට ගැළවුම්කාරයෙකු නැතුව, මිතුරෙකු නැතුව, බලාපොරොත්තුවක් නැතුව, සදාකාලයටම නැතිවීම නමැති ආන්ධකාරය මධ්‍යයේ නිම නොවන කාලකණ්නිකම තුල ඔබ ඔබට සව්බවත විට, බරපතල දේවල් ගැන මිස, වෙන කිසිවක් ගැන නොසිතා සිටින්නට ඔබට බොහෝ කාලයක් ඇති වෙයි. **"අප වෙත මහත්වූ ගැළවීමක් ප්‍රතික්ෂේප කලොත්, අපව එයින් බෙරෙන්නේ කොහොමද?"** (හෙබ්‍රෙව් 2:3)